ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2006 අංක 36 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2006** නොවැම්බර් මස **06** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2006 අංක 36 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

එල්. ඩී.– ඕ. 20/2005

### විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2006 අංක 36 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ පනතේ (1997 අංක 12 දරන පනත මගින් ඉවත් කොට ප්‍රතියෝජනය කරන ලද) දෙවන උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 112 වන පරිච්ඡේදයේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

දෙවන උපලේඛනය (62 වන වගන්තිය)

| *කුමන කාර්යය සඳහාද යන වග* | *ගෙවිය යුත්තේ කාට ද යන වග* | *ගෙවනු ලබන්නේ කා විසින් ද යන වග* | *මුදල රු. ශත* |
|---|---|---|---|
| 1. ඔහුගේ කාර්යාලයේ දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම. | රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 50.00 |
| 2. වෙනත් ඕනෑම කාර්යාලයක දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම. | රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 100.00 |
| 3. ඔහුගේ කාර්යාලය හැර වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 100.00 |
| 4. ඔහුගේ කාර්යාලය හැර වෙනත් යම් ස්ථානයක දී විවාහ දැන්වීමක් ඇතුලත් කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | අයදුම්කරු | රු. 150.00 |
| 5. ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 250.00 |

| *කුමන කාර්යය සඳහාද යන වග* | *ගෙවිය යුත්තේ කාට ද යන වග* | *ගෙවනු ලබන්නේ කා විසින් ද යන වග* | *මුදල රු. ශත* |
|---|---|---|---|
| 6. ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 100.00 |
| 7. ඔහුගේ කාර්යාලයේ දී විවාහය සිදු කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 100.00 |
| 8. 38 (1) වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහය සිදු කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 250.00 |
| 9. 38 (2) වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහය සිදු කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 1000.00 |
| 10. 38 (2) වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහය සිදු කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 300.00 |
| 11. 38 (2) වන වගන්තිය යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටත දී විවාහය සිදු කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 350.00 |
| 12. ලියාපදිංචිය ප්‍රසිද්ධ පූජනීය ස්ථානයක දී සිදු කරන ලද විවාහයක් ලියාපදිංචි කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 25.00 |
| 13. විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 10.00 |
| 14. විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 10.00 |
| 15. විවාහ දැන්වීමක් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීම. | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | විවාහ පාර්ශ්වයන් | රු. 10.00 |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.